සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2021(2022 මාර්තු)

09 ශ්‍රේණිය | ඉතිහාසය I | කාලය පැය 02

නම/ විභාග අංකය :- ..........................................................................................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ශ්‍රී ලංකාවට පැමිණි, දෙවන යුරෝපීය ජන කණ්ඩායම වූ ලන්දේසීන්ගේ මව් රට කුමක් ද?

(1) පෘතුගාලය (2) ඕලන්දය

(3) මහා බ්‍රිතාන්‍යය (4) ප්‍රංශය

(2) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් මෙරට මුහුදු බඩ ප්‍රදේශ වල ගෙන ගිය පාලනයට එරෙහිව ක්‍රි.ව. 1797 විරෝධතා අරගලයක් ඇතිවීමට බලපෑ ආසන්නම හේතුව කුමක් ද?

(1) බදු එකතු කිරීම සඳහා අව්මිල්දාර්වරු නම් මදුරාසි නිලධාරින් පත් කිරීම

(2) බදු වෙන්දේසි කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

(3) රා-අරක්කු වැනි මත්පැන් මත බදු පැනවීම.

(4) පොල්ගස් බද්ද පැනවීම නිසා ජනතාව මහත් පීඩනයකට පත් වීම.

(3) ලන්දේසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ පාලනය පිළිබඳ තීරණ ගත් ඉහළම මණ්ඩලය වූයේ,

(1) ඕලන්ද පාලකයා සහ ඔහුගේ උපදේශක මණ්ඩලය යි.

(2) බතාවියානු ආණ්ඩුකාරවරයා සහ සහායක සභාව යි.

(3) ඕලන්දයේ සිටි VOC සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය යි.

(4) ශ්‍රී ලංකාවේ සිටි ආණ්ඩුකාරවරයා සහ උපදේශක මණ්ඩලය යි.

(4) 1818 පළමු නිදහස් අරගලය සඳහා බලපෑ ආසන්නම හේතුව වූයේ,

(1) රජෙකු නොමැති වීම නිසා ජනතාව තුල ඇති වූ කලකිරීම යි.

(2) උඩරට රදළයන්ගේ බලතල හා වරප්‍රසාද සුරක්ෂිත නොවීම යි.

(3) වෙල්ලස්ස ප්‍රදේශයේ මඩිහේ මුහන්දිරම් ලෙස මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම යි.

(4) බ්‍රිතාන්‍යයන් යටතේ බුදු දහම විනාශ වෙතැයි බියක් ඇති වීමයි.

(5) ශ්‍රී ලංකාව තුල ප්‍රථම වතාවට කෝපි වත්තක් ආරම්භ කරන ලද්දේ,

(1) ජෝර්ජ් බර්ඩ් විසිනි.

(2) එඩ්වඩ් බාන්ස් විසිනි

(3) තෝමස් මෙට්ලන්ඩ් විසිනි

(4) ජෝන් ඩොයිලි විසිනි

(6) දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ කවුරුන් විසින්ද?

(1) හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරවරයා

(2) වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා

(3) විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා

(4) ආතර් ගෝර්ඩන් ආණ්ඩුකාරවරයා

(7) බෞද්ධ පුනරුද ව්‍යාපාර සමයේ දී අනුරාධපුර ප්‍රදේශයේ නටබුන් වී ගිය බෞද්ධ වෙහෙර විහාර ආරක්ෂා කර ගැනීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ කවුරුන්ද?

(1) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා　(2) අනගාරික ධර්මපාලතුමා

(3) ඩී.බී. ජයතිලක මැතිතුමා　(4) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා

(8) හින්දු සහ ඉස්ලාම් ආගමික පුනර්ජීවනයක් සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලද නායකයන් වූයේ,

(1) ආරුමුග නාවලර් තුමා සහ එම්.සී. සිද්දි ලෙබ්බේ මහතා

(2) නටේස අයියර් සහ ටී.බී. ජයා මහතා

(3) ආරුමුග නාවලර් තුමා සහ එම්. නඩේසන් මහතා

(4) නටේස අයියර් සහ එම්.සී. සිද්දි ලෙබ්බේ මහතා

(9) ආසියානු ප්‍රදේශ වල ලන්දේසි බලය පිහිටුවීම සඳහා කටයුතු කල ලන්දේසි ජාතිකයා කවුරුන් ද?

(1) අපොන්සෝ ද අල්බ්‍යුකර්　(2) පීටර්සන් කූන්

(3) විලම් ෆැලෙක්　(4) ෆන් එක්

(10) 1857 සිපෝයි කැරැල්ල ඇතිවීම කෙරෙහි බලපෑ ආසන්නම හේතුව වූයේ,

(1) ඉංග්‍රීසින් ඉන්දියානු ප්‍රදේශ අත්පත් කර ගැනීමේදී අනුගමනය කල ප්‍රතිපත්තියයි.

(2) වෙළඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්ති නිසා ඉන්දීය දේශීය කර්මාන්ත අභාවයට යාමයි.

(3) ඉන්දියාව තුල ක්‍රිස්තියානි ආගම පැතිරවීමට ඉංග්‍රීසින් ක්‍රියා කිරීමයි.

(4) ගවතෙල් හා ඌරු තෙල් මිශ්‍ර කරන ලද පතොරම් සහිත එන්පීල්ඩ් නම් රයිපල් වර්ගය භාවිතා කිරීමට ඉංග්‍රීසින් විසින් සිපෝයි භටයන්ට බල කිරීමයි.

(11) ඉන්දියානු ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා ලෙස පත්වූයේ කවුරුන්ද?

(1) ඩබ්ලිව්.සී. බෙනර්ජි　(2) දඩබායි නඖරෝජි

(3) සුරේන්ද්‍රනාත් බැනර්ජි　(4) බාල් ගංගාධාර් තිලක්

(12) කෝල්බෲක් කොමිසම මගින් ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම සඳහා ගෙනෙන ලද යෝජනාව වූයේ,

(1) උඩරට පහතරට ඒකාබද්ධ කිරීම.

(2) පරිපාලන කටයුතු සඳහා රට පළාත් පහකට බෙදීම.

(3) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.

(4) ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම.

(13) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා ලෙස පත් වූයේ,

(1) පොන්නම්බලම් රාමනාදන් මහතා ය. (2) පොන්නම්බලම් අරුනාචලම් මහතා ය.

(3) ඩී.බී. ජයතිලක මහතා ය. (4) ජෝන් ද සිල්වා මහතා ය.

(14) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු වැදගත්ම දේශපාලන වරප්‍රසාදය කුමක් ද?

(1) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම. (2) විධායක කාරක සභා පිහිටුවීම.

(3) අග්‍රාණ්ඩුකාර ධුරයක් ස්ථාපිත කිරීම. (4) සර්වජන ඡන්ද බලය හිමිවීම.

(15) ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා ලෙස පත්වන්නේ කවුරුන් ද?

(1) හෙන්රි මන්ක් මේසන් මුවර්. (2) සර් ඔලිවර් ගුණතිලක.

(3) විලියම් ගොපල්ලව. (4) හියු ක්ලිපර්ඩ්.

(16) ක්‍රි.ව. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ව්‍යවස්ථාදායකය හඳුන්වන ලද්දේ කුමන නමකින් ද?

(1) රාජ්‍ය මන්ත්‍රණ සභාව. (2) ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව.

(3) පාර්ලිමේන්තුව. (4) ජාතික රාජ්‍ය සභාව.

(17) ජනතාව විසින් ඍජුවම නීති සම්පාදන කටයුතු සඳහා සහභාගීවන මැතිවරණය වන්නේ,

(1) පාර්ලිමේන්තු මැතිවරණය යි. (2) ජනමත විචාරණය යි.

(3) ජනාධිපතිවරණය යි. (4) පළාත් සභා මැතිවරණය යි.

(18) ක්‍රි.ව. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතලයක් වන්නේ මින් කුමක් ද?

(1) අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කිරීම.

(2) ජාතික උත්සව වල මුලසුන ගැනීම.

(3) පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීම.

(4) අගමැතිවරයා පත් කිරීම.

(19) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රථම පියවර වූයේ,

(1) පොල්ගොල්ල ව්‍යාපාරය ආරම්භ කිරීම යි.

(2) වික්ටෝරියා ජලාශය ඉදිකිරීම යි.

(3) විදුලි බලය උත්පාදනය කිරීම සඳහා බෝවතැන්න ජලාශය ඉදිකිරීම යි.

(4) රන්දෙනිගල ජලාශය ඉදිකිරීම යි.

(20) පහත A හා B තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම | A අනගාරික ධර්මපාල තුමා |
| 2. සිංහල බෞද්ධයා පුවත් පත ඇරඹීම | B පූජ්‍ය හික්කඩුවේ සුමංගල හිමි |
| 3. ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම | C හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා |
| 4. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම | D බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි |

(1) B A C D (2) C A D B (3) D B A C (4) A C D B

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021(2022 මාර්තු)**


**09 ශ්‍රේණිය** | **ඉතිහාසය II**

නම/ විභාග අංකය :- ...................................................................................................................

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) (අ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමයෙහි දී ඇති අක්ෂර වලට අදාල නම් පහත ලයිස්තුවෙන් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) මහවැලි ගඟ
(ii) මහනුවර
(iii) දෙවුන්දර තුඩුව
(iv) ත්‍රිකුණාමලය
(v) මන්නාරම
(vi) කොළඹ




(ලකුණු 06)

(ආ)


A රූපය



(i) A රූපයේ දැක්වෙන්නේ කවුරුන් ද?
(ii) මෙතුමා කුමන රාජධානියක පාලකයා ලෙස කටයුතු කරන ලද්දේ ද?
(iii) මෙතුමා හමු වීමට පැමිණි වැදගත්ම ලන්දේසි දූතයා නම් කරන්න.

(ලකුණු 03)

B රූපය



(i) A රූපයේ දැක්වෙන්නේ කවුරුන් ද?
(ii) මොහු කුමන රටක නිදහස් සටන් ව්‍යාපාරය සඳහා නායකත්වය සපයන ලද්දේ ද?
(iii) මෙතුමා හඳුන්වනු ලබන අන්වර්ථ නාමය කුමක් ද?

(ලකුණු 03)

(2) (i) පහත සඳහන් සිද්ධීන්ට සම්බන්ධ පුද්ගලයන් දී ඇති පිළිතුරු අතරින් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - I විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා -
B - උඩරට රාජධානිය ආක්‍රමණය කල ලන්දේසි ආණ්ඩුකාරවරයා -
C - බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේලා රැගෙන ඒම සඳහා ලන්දේසින්ගේ නැව් ලබා ගත් උඩරට පාලකයා -

(II විමලධර්මසූරිය රජු, I විමලධර්මසූරිය රජු, බැරන් වැන් එක්, විලෙම් පැලෙක්, II රාජසිංහ රජු (ලකුණු 03)

(ii) ලන්දේසින් විසින් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙරට පිහිටුවන ලද අධිකරණ පද්ධතියට අයත් උසාවි වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ආනයන වියදම අඩු කර ගැනීම සහ අමතර ආදායම් ලබා ගැනීමේ අරමුණින් ලන්දේසින් අනුගමනය කල වැඩි පිළිවෙල විස්තර කරන්න. (ලකුණු 05)

(3) (i) උඩරට රාජ්‍යය හා ඉංග්‍රීසීන් අතර සබඳතා තහවුරු කර ගැනීම සඳහා උඩරටට පැමිණි ඉංග්‍රීසි දූතයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A - වර්ෂ 1818 නිදහස් සටන සඳහා බලපෑ ආසන්නම හේතුව නම් කරන්න. (ලකුණු 02)

B - එම නිදහස් සටනට නායකත්වය සැපයූ උඩරට රදළයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(iii) 1848 දෙවන නිදහස් අරගලය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(4) (I) වතු වගාව යටතේ බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දෙන ලද වතු බෝග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) මෙරට වතු වගාවේ දියුණුව කෙරෙහි බලපාන ලද කෝල්බෲක් යෝජනා දෙකක් නම් කරන්න. (ලකුණු 2 x 2 = 04)

(iii) තේ වගාව මෙරට ප්‍රමුඛ අපනයන ආර්ථික බෝගය බවට පත්වීම කෙරෙහි බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(5) (i) පහත නම් සඳහන් යුරෝපා ජාතීන් විසින් ඉන්දියාව තුල පිහිටුවන ලද වෙළඳ මධ්‍යස්ථාන වරහන් තුල ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

A - ලන්දේසි B - බ්‍රිතාන්‍ය C - ප්‍රංශ
(ගෝව, ගුජරාට්, මදුරාසිය, බතාවිය, පොන්ඩිචේරි) (ලකුණු 03)

(ii) A - ඉන්දියාව තුළ ආගමික පුනරුදයක් ඇති කිරීම සඳහා මූලික පියවර ගන්නා ලද්දේ කවුරුන් විසින්ද? (ලකුණු 01)

B - ඉන්දියාව තුල සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා දායක වූ ආගමික සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) මහත්මා ගාන්ධි විසින් ඉන්දියාව තුල ක්‍රියාත්මක කරනු ලැබූ අවිහිංසාවාදී සටන් ව්‍යාපාර තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(6) (i) බ්‍රිතාන්‍යයන් විසින් පහත සඳහන් වර්ෂ වලදී මෙරටට හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වරහන් තුල ඇති පිළිතුරු අතරින් තෝරා A, B, C අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - 1833 B - 1931 C - 1947

(සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය, මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය, ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය, කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය) (ලකුණු 03)

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වල කැපී පෙනෙන ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) වර්ෂ 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වල කැපී පෙනෙන ලක්ෂණ තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(7) (i) A - නිදහස් ලංකාවේ ප්‍රථම අගමැතිවරයා -

B - නිදහස් අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දුන් අධ්‍යාපන ඇමතිවරයා -

C - මෙරට ප්‍රථම විධායක ජනාධිපතිවරයා - පිළිවෙලින් නම් කරන්න. ලකුණු 03)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කර ඇති මූලික මිනිස් අයිතිවාසිකම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
**DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE**

[redacted]

**09 ශ්‍රේණිය** | **ඉතිහාසය**

පිළිතුරු පත්‍රය

<u>I කොටස</u>

| | | | |
|---|---|---|---|
| (1) 2 | (6) 2 | (11) 1 | (16) 4 |
| (2) 4 | (7) 4 | (12) 3 | (17) 2 |
| (3) 3 | (8) 1 | (13) 2 | (18) 3 |
| (4) 3 | (9) 2 | (14) 4 | (19) 1 |
| (5) 1 | (10) 4 | (15) 1 | (20) 2 (C A D B) |

(ල. **2x20 = 40)**

II කොටස

(1) (අ) සිතියමේ ලකුණු කොට ඇත. (ල. **1x6 = 6)**

(ආ) A රූපය

(i) දෙවන රාජසිංහ රජු
(ii) උඩරට රාජධානිය / මහනුවර රාජධානිය / සෙංකඩගල රාජධානිය
(iii) කර්නල් ජෙරාඩ් හල්ෆඩ් (ල. **1x3 = 3)**

B රූපය

(I) මහත්මා ගාන්ධිතුමා
(ii) ඉන්දියාව
(iii) අවිහිංසාවාදයේ පියා (ල. **1x3 = 3)**

(2) (i) A - ජොරිස් වැන් ස්පීල් බර්ජන්
B - බැරන් වැන් එක්
C - II විමලධර්මසූරිය රජු (ල. **1x3 = 3)**

(ii) මහාධිකරණය (රාද් වැන් ජස්ටිට්)
සිවිල් උසාවිය (සිවිල් රාද්)
ඉඩම් උසාවිය (ලැන් රාද්)
පිස්කල් උසාවි (ල. **1x4 = 4)**

(iii)
* මුතුරාජවෙල අස්වැද්දීම
* යෝධවැව,කන්තලේ වැව ආදි වැව් ප්‍රතිසංස්කරණය කිරීම මගින් කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා කටයුතු කිරීම.
* උක්, ගම්මිරිස්, එනසාල්, කෝපි, මල්බෙරි, ඉන්ඩිගෝ ආදී වගාවන් දියුණු කිරීම.
* රෙදි විවීම, රෙදි සායම් කිරීම හා උළු ගඩොල් ආදී කර්මාන්ත දියුණු කිරීම.
* හැමිල්ටන් ඇළ වැනි ඇළ මාර්ග දියුණු කොට භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගැනීම.
* යාපනය ප්‍රදේශයේ පොල් වගා කිරීම.

(ල. **05)**

(3) (i) ජෝන්, ෆයිබස්, රොබට් ඇන්ඩෲස්, හියු බොයිඩ් (ල. 1x3 = 3)

(ii) A - ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ මඩිහේ මුහන්දිරම් තනතුර හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් ජාතිකයෙකුට ලබා දීම.

B - කැප්පෙටිපොළ නිළමෙතුමා, මඩුගල්ලේ දිසාව, බුටෑවේ රටේ රාළ, කොහුකුඹුරේ රටේ රාළ, කිවුලේගෙදර මොහොට්ටාල, පිළිමතලව්වේ දෙවන අදිකාරම් ආදී............

(iii) * ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් යුධ නීතිය පනවා (මාර්ෂල් ලෝ) කැරලිකරුවන් මර්ධනය කිරීම. (ල. 2x2 = 4)

* සටන්කරුවන් අතර පැවති පණිවුඩ හුවමාරු සබඳතා දුර්වල වීම.
* සටන්කරුවන් අතර පැවති අසමගිය.
* ඉංග්‍රීසින් විසින් සටන් නායකයන් අත්අඩංගුවට ගැනීම සහ සමහර රදලයන් ඉංග්‍රීසින් හට පක්ෂපාතී වීම. (ල. 5)

(4) (I) තේ, රබර්, පොල්, කොකෝවා, සිංකෝනා (ල. 1x3 = 3)

(ii) * රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කිරීම.
* දේශීය හා පෞද්ගලික ව්‍යවසායකයන්ට ඉඩම් මිළදී ගැනීමට අවස්ථාව සලසා දීම.
* පෞද්ගලික ව්‍යාපාර අරමුණු වලට ගැලපෙන පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම. (ල. 2x2 = 4)

(iii) * තේ වගාවට උචිත පරිසරයක් මෙරට තෙත් කලාපයේ පැවතීම.
* ලන්ඩන් හා ලෝක වෙළඳ පොලේ මෙරට තේ සඳහා ඉහළ මිලක් හිමි වීම.
* දුම්රිය හා මහාමාර්ග පහසුකම් වර්ධනය වීම තේ වගාවේ උන්නතිය සඳහා බලපෑම.
* දකුණු ඉන්දියානු ශ්‍රමිකයන් ගෙන්වා ගැනීමට හැකිවීම නිසා පහසුවෙන් හා ලාභදායි ලෙස ශ්‍රමය ලබා ගැනීමට හැකි වීම.
* අඩු නිෂ්පාදන වියදමකින් වැඩි ලාභ ඉපයීමට හැකි වීම. (ල. 5)

(5) (I) A-බතාවිය B-මදුරාසිය C-පොන්ඩිචේරි (ල. 1x3 = 3)

(ii) A -රාම් මෝහන් රෝයි (ල. 1)
B - බ්‍රහ්ම සමාජය, ප්‍රාර්ථනා සමාජය. ආර්ය සමාජය (ල. 1x3 = 3)

(iii) * <u>චම්පරන් ව්‍යාපාරය</u>
බිහාර් ප්‍රාන්තයේ චම්පරන් දිස්ත්‍රික්කයේ ඉන්ඩිගෝ වගාකල ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා ගෙන ගිය වැඩ සටහන.

* <u>ඛේඩා ව්‍යාපාරය</u>
ගුජරාජයේ ඛේඩා ප්‍රදේශයේ වසංගත රෝග හා නියගය නිසා බදු ගෙවීමට නොහැකිව සිටි ජනතාවට සහන අත්කර දීම සඳහා ගෙන ගිය සටන.

* සත්‍යග්‍රහ ව්‍යාපාරය
* සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය දණ්ඩි පා ගමන (ල. 5)

(6) (i) A-1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
B-1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
C-1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ (ල. 1x3 = 3)

(ii) * රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
* සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
* විධායක කාරක සභා පිහිටුවීම
* ආණ්ඩුකාරවරයා සහ රාජ්‍ය නිළධාරීන් තිදෙනා (ල. 1x4 = 4)


(iii) * ආණ්ඩුකාරධුරය වෙනුවට අග්‍රාණ්ඩුකාරවරයෙක් පත් කිරීම.
* ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටුවීම.
* අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම.
* රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම. (ල. 05)

(iv) කෘෂිකර්මාන්තය වී වගාව හා හේන් ගොවිතැන / ගෙවතු වගාව/ වැසි ජලය භාවිතය / අලුත් වාරි පද්ධති ඉදි නොවීම
වානිජ බෝග වගාව උදා : කුරුඳු, ගම්මිරිස්, කරදමුංගු ....... / මුතු මැණික්, ඇත්දල, ඇතුන්..........
විදේශ වෙළඳාම උදා : චීනය, අරාබිය, ඊජිප්තුව
අභ්‍යන්තර වෙළඳාම ..........
(විස්තර දෙකට ල.5 යි දෙන්න.)

(7) (i) A - මහාමාත්‍ය ඩී.එස්. සේනානායක (ල. 03)
B - C.W.W. කන්නන්ගර මැතිතුමා
C - J.R. ජයවර්ධන මහතා

(ii) * කතා කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
* කැමති රැකියාවක් කිරීමේ අයිතිය
* කැමති ආගමක් ඇදහීමේ අයිතිය
* වධහිංසා වලින් මිදීමේ අයිතිය
* නීතිය ඉදිරියේ සමානාත්මතාවයෙන් සලකනු ලැබීමේ අයිතිය (ල. 04)

(iii) * වියළි කලාපයේ ගොවි බිම් සඳහා නිත්‍ය ජල පහසුකම් ලබා දීම.
* විදුලි බල නිෂ්පාදනය
* නව ජනාවාස බිහි කිරීම
* මිරිදිය මසුන් බෝ කිරීම
* නව රැකියා අවස්ථා බිහි කිරීම
(ල. 05)


G
මන්නාරම E
A ත්‍රිකුණාමලය
H
මහනුවර
B
D
කොළඹ C
F
දෙවුන්දර තුඩුව